331.2592
D28

# අධ්‍යාපන පොදු සහතික උසස් පෙළ සඳහා ක්‍රියාත්මක වන

# "දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති" වැඩසටහන පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## (අගනුවර පිරිමි විදුහලක් ඇසුරින්)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති (M.Ed) උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධනයකි.

එච්.පී.එම්. මංගල දේවි
ලියාපදිංචි අංකය - 50207519
2002/2003

OPEN UNIVERSITY
69088

අධ්‍යාපන පීඨය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල
නුගේගොඩ
2010

69088

## සංක්ෂිප්තය

ජාතියේ දරුවන්ගේ අධ්‍යාපනය ඉතා භාරදූර වූත්, වැදගත් වූත් කාර්යයකි. ඒ සම්බන්ධව ඇති ආකල්ප හා ඇගයීම් පසුගිය වර්ෂ ගණනාව තුළ වෙනස් වෙමින් පැවතිණි. පාසල් වයසේ දිම ඔවුන් තියුණු තරගකාරී තත්ත්වයකට ඇද දමා ඇත. පාසල් අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය පූර්ණ පෞරුෂ සංවර්ධනයකින් යුත් පුද්ගලයෙක් සමාජයට දායාද කිරීම වුවත් ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින ප්‍රධානම චෝදනාව වන්නේ මෙම කාර්යෙහිලා පාසල ඕය වගකීම් ඉටු කිරීමට අපොහොසත් වී ඇති බවයි. එබැවින් අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණයක්, ප්‍රතිසංවිධානයක් කිරීම අප්‍රමාදව කළ යුතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1997 වර්ෂය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා විශේෂ වර්ෂයක් විය.

1997 වර්ෂයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පෙර පාසල් අවධියේ සිට තෘතියික අවධිය දක්වාත්, ඉන් ඔබ්බට වැඩිහිටි අධ්‍යාපනය දක්වාත් ඉතා පුළුල් ලෙස විහිදුණි. මෙම ප්‍රතිසංස්කරණ යටතේ අ.පො.ස.(උ.පෙළ) සිසුන් සඳහා අනිවාර්ය ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ලෙස දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති හඳුන්වා දෙන ලදි. මෙහි වැදගත්ම ලක්ෂණය වන්නේ සිසුන්ගේ පෞද්ගලික ලැදියා හා නිසග කුසලතා මත පදනම්වූ ව්‍යාපෘති තෝරා ගැනීමයි. මේ තුළ ක්‍රියාත්මකව සම්බන්ධ වීමෙන් ලබන අත්දැකීම් තුළින් තම ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය පූර්ව නිපුණතා ලබා ගැනීමට අවශ්‍ය පරිසරය සකස් වීමත්, නිසග කුසලතා ප්‍රදර්ශනයට මග පෑදීමත්, නිදහසේ සිතීමට, නිර්මාණකරණයට හා පර්යේෂණ කටයුතු වලට අවශ්‍ය මනසක් උරුම කර දීමටත් ඉවහල් වේ යැයි උදෙක්ම බලාපොරොත්තු වේ.

මෙම ව්‍යාපෘති ඉගෙනුම් ක්‍රමය පළමු වරට ප්‍රබල අධ්‍යාපන උපක්‍රමයක් ලෙස 21 සියවසේ ඇමරිකාවේ බිහිවූ ප්‍රකට දාර්ශනිකයකු සහ අධ්‍යාපනඥයෙකු වූ ජෝන් ඩුවි විසින් හඳුන්වා දෙනු ලැබිය.. අධ්‍යාපනය සහභාගී වීම හා අත්දැකීම් තුළින් සිදුවන බව ද, එය ඥානය ලබා ගැනීමේ හොඳම ක්‍රියාමාර්ගය බවද ප්‍රකාශ කළ ඩුවි සක්‍රිය අධ්‍යාපනය පාසල තුළින් බිහි කළ යුතු බවත්, ඊට නිදහස සිසුන්ට ලබා දිය යුතු බවත්, අධ්‍යාපනය හරවත් වීමට පාසල් කටයුතු හා සමාජයීය ජීවන අත්දැකීම් සම්බන්ධ කළ යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කළේ ය.

ඉහත දැක්වූ දාර්ශනික අදහස් වලට පදනම්ව වර්තමානයේ පාසල් තුළ ක්‍රියාත්මක වන අ.පො.ස.(උ.පෙළ) දිවි පැවැත්ම සඳහා නිපුණතා සංවර්ධන ව්‍යාපෘති තෝරාගත් පාසලක ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර එම අභිමතාර්ථ කෙතෙක් දුරට ඉටු වී ඇත්දැයි විමසා බැලීමට අධ්‍යයනයක් කිරීම කාලෝචිත යැයි අදහස් කෙරුණි.

මෙම වැඩසටහන හඳුන්වා දීම තුළින් ප්‍රධාන වශයෙන්ම අපේක්ෂා කරනු ලැබුයේ කුසලතා පිරි සිසුන්ගේ නිසග හැකියාවන් මතුකර, අධික ශාස්ත්‍රීය නැඹුරුව අවම කිරීමෙන්

ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් ලෙස දිගින් දිගටම ක්‍රියාත්මක වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් වෙත දිශාභිමුඛ කිරීමයි.

විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවද පාසල තුළ ව්‍යාපෘති වැඩසටහන නොකඩවා යාන්ත්‍රික ස්වරූපයෙන් හෝ ක්‍රියාත්මක වන බව මෙම අධ්‍යයනයෙන් පැහැදිලි විය. ගුරු සිසු දෙපිරිසම මෙම වැඩසටහනේ ගුණාත්මකභාවය අවබෝධ කරගෙන සිටිය ද විභාග මූලික නොවූ ප්‍රායෝගික නිපුණතා අත්පත් කර දෙන වැඩසටහනකට වඩා විෂයමාලාව ආවරණය කිරීමට හා උසස් ප්‍රතිඵල පසුපස හඹා යෑමට අපමණ වෙහෙසක් දෙපාර්ශවයම දරන බව තහවුරු විය. අධික ශාස්ත්‍රීය නැඹුරුව ඒ අයුරින් ම පවත්නා බවත් අනාවරණය විය.

පර්යේෂණය අවසානයේ මෙම වැඩසටහන වර්තමානයේ පවතින තත්ත්වයට වඩා ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කළ හැකි ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කෙරේ.

දරුවන් උපතින් උරුම කරගත් සැඟවී ඇති කුසලතා මතු කර යහපත් පෞරුෂයකින් හෙබි නිර්මාණශීලි විවේචනශීලි, ස්වාධීන චින්තනයෙන් යුත් පරිපූර්ණ පුද්ගලයන් බවට පත්කළ යුත්තේ පාසල් අධ්‍යාපනය තුළිනි. යුගයේ අවශ්‍යතාවයට අනුව එවන් පුරවැසි පිරිසක් බිහි කිරීමට නව ප්‍රතිසංස්කරණ තුළින් දරන ලද ක්‍රමවේදයක ප්‍රතිඵල අනාවරණය කර ගැනීමට ගත් උත්සාහයක් ලෙස මෙම පර්යේෂණය හඳුන්වා දිය හැකිය.